
# අක්කගේ උපන් දිනේ




එන්.ජී. නෙසාකි යෙහන්සා ඉලංගකෝන්

# අක්කාගේ උපන් දිනේ

එන්.ජී. නෙසාකි යෙහන්සා ඉලංගකෝන්

# අක්කගේ උපන් දිනේ


## එන්.ජී. නෙසාකි යෙහන්සා ඉලංගකෝන්

3 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර



**ප්‍රකාශිත දිනය**

2025.02.08

ISBN - 978 - 624 - 208 - 494 - 7


**කතෘගේ වෙනත් කෘති**

පුංචි නෙසාකිගේ පුංචි හොඳ වැඩේ - 2023

දහස්පෙතියා පැළය - 2024

# පිදුම

මා ඉගෙනුම ලබන
මහාමායා බාලිකා විදුහලේ
විදුහල්තිතුමිය ඇතුළු
ගුරු මෑණිවරුන් සහ
ගුරුපියවරුන් ඇතුළු
මාගේ පංති භාර ගුරුතුමිය සහ
මාගේ මිතුරියන් හට සහ
මාගේ දෙමාපියන් දෙපලට
මාගේ අක්කාට
මේ පොත් පිංච
ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය<br>
ශශිකලා සේනාධීර<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



අම්මයි තාත්තයි දියණියන් දෙදෙනෙක් සිටියා. මේ පවුලේ සියලු දෙනා හරිම සතුටින් ජීවත් වුණා. මේ අය එයාලාට පුළුවන් විදියට අනිත් අයට උදව් කළා.

මේ පවුලේ දෙමාපියන් දෙදෙනා දියණියන් දෙදෙනට මහන්සි වී උගන්වනවා වාගේම දරුවන්ට හොඳ නරක මනුෂ්‍යකම් හොඳින් නිතරම කියා දුන්නා. කොච්චර හොඳින් ඉගෙන ගත්තා උනත් මිනිසුන්ගේ දුක හඳුනා නොගත්තොත් ඒ දේවල් නිසි පලක් නැති බව හොඳින් කියා දුන්නා. ඉතින් ඔහොම කාලය ගෙවී යද්දී ලොකු දියණියගේ උපන් දිනය ළඟටම ආවා. ඉතින් පවුලේ සියලු දෙනාම සවස තේ බොන්න මේසය ළඟින් පුටුවල වාඩි වුණා.

"අම්මා අපි මෙදා සැරේ මගේ උපන් දිනයට කේක් හදනවාද?" ලොකු දියණිය අම්මාගෙන් ඇසුවා.




“මෙදා සැරේ දුවගේ උපන් දිනය අපි අලුත් තැනක අලුත් යාළුවොත් එක්ක අපි මෙවරත් සමරන්න හිතේ තියන් ඉන්නේ” කියා අම්මා කිවුවා.

“අලුත් තැනක අලුත් යාළුවො එක්ක, ඒ කොහේද තාත්තේ” පොඩි දියණිය ඇසුවා.

“අපි හිතාගෙන ඉන්නේ අක්කාගේ උපන් දිනය මෙදා සැරේ ළමා නිවසට ගිහින් සමරන්න” කියා තාත්තා කිවුවා.

“මොකක්ද තාත්තේ ළමා නිවාසයක් කියන්නේ?” පොඩි දියණිය තාත්තාගෙන් ඇසුවා.

“ළමා නිවාසයක් කියන්නේ දුවේ දෙමාපියන් නෑදෑයන් කාත් කවුරුවත්


අපි අසරණ අයට
උදවු කරමු
1234

නැති ඔයාලා වගේ දරුවෝ අසරණවෙලා ඉන්න තැනක්. එයාලා හරිම සතුටුවෙයි අපි එහේ ගියාම. ඒක හොඳ දෙයක් දුවේ" කියා කිවුවා.
"අනේ ඔව්, හරිම හොඳයි. අපේ ගුරුතුමිත් කියාදුන්නා අසරණ අයට පිහිට වෙන්න ඕන කියලා".

ඉතින් කාලය ගෙවී ගිහින් ලොකු දියණියගේ උපන් දිනය ලඟටම ආවා.
"අම්මා මොනවද කරන්නේ. අක්කාගේ උපන් දිනයට කේක් හදනවාද" කියා ඇසුවා.
"ඔව් දුවේ හෙට අක්කාගෙ උපන් දිනය නිසා මම මේ කේක් එක හදන්න ගත්තා .



අපට වැඩ ගොඩක් තියෙනවානේ"
කියා අම්මා කිවුවා.
"එහෙනම් අම්මෙ මමයි අක්කායි
තාත්තායි ගෙවල් අතු ගාලා මිදුලු
අතු ගාන්නම්. එතකොට අම්මාට
ගොඩාක් පහසුයිනේ " කියා පොඩි
දියණිය කිවුවා.
"හරිම හොඳයි. මම මම ඔයාලාට
හදන කේක් වලින් තව රසට මොනවා
හරි හදලා දෙන්නම්කෝ"
"හරිම හොඳයි. අපි බෙදාගෙන කමු
නේද අම්මේ."

"ඔව් ඔව් බෙදා ගෙන තමයි කන්න
ඕනේ කියා " කියා අම්මා කිවුවා.




පොඩි දුව හරිම සතුටින් ගෙදර වැඩ කරන්න අක්කාත් තාත්තාත් සමඟ එකතු වුණා.

"අද අපි ටිකක් කලින් නිදියගමු නේද" කියා තාත්තා කිව්වා.

"ඔව් අපි කලින් නිදියගෙන හෙට උදෙන්ම නැගිටිමු. උදෙන්ම පන්සලට ගිහින් ඇවිත් වැඩ ටික ඉක්මණින් කර ගන්නත් ඕනෙනේ. ඒ නිසා අපි බුදුන් වැඳලා කලින් නිදියගමු " කියා අම්මා කිවුවා.
"හරිම හොඳයි අපි එහෙනම් දැන් බුදුන් වඳිමු" කියා ලොකු දියණිය අම්මාට කිවුවා.

පසුවදා උදෙන්ම අවදි වුණා.
තාත්තාත් අම්මාත් නංගිත් ලොකු
දියණියට උපන් දිනයට සුභ පැතුවා.
ඉන්පසු පන්සල් ගිහින් ඇවිත් ඔවුන්
ඉක්මණින් කෑම සහ රසකැවිලි කේක්
සියලු දේ සදා ගත්තා.
"ඉක්මණින් ලෑස්ති වෙන්න ඕනේ" කියා
තාත්තා කිවුවා.
"හරි අපි ඉක්මණින් ලෑස්ති වෙනවා.
බලන්නකෝ තාත්තේ අක්කාගේ
ලස්සන හරියට බෝනික්කියක් වාගේ
නේද?. " කියා පොඩි දියණිය
තාත්තාට සිනාසී කිවුවා.
"ඔව් ඔව් අක්කා විතරද ඇයි ඔයත්
බෝනික්කියක් වාගේ තමයි " කියා
අම්මා ද සිනාසී කිවුවා.






"එහෙනම් දැන් අපි යමු" කියා
තාත්තා කිවුවා .
"ඔව් අපි දැන් ඉක්මණින් යමු.

හැම දෙයක්ම අමතක නොකර දා ගමුනේද අම්මා" කියා ලොකු දියණිය කිවුවා.

"ඔව් හැම දේම මම මේස උඩ තියලා තියෙන්නේ . අමතක නොකර සියලු දේම අරගෙන යමු " කියා අම්මා ද කිවුවා.

"අපි ගෙනවිත් දෙන්නම්. තාත්තා මේවා පිළිවෙලට තියා ගන්න. එතකොට අපිට ඉක්මණින් යන්න පුලුවන්" කියා දියණියන් දෙදෙනා කිවුවා.

ඉන්පසු පවුලේ සියලු දෙනා ළමා නිවසට යාමට පිටත් වුණා.

ඔවුන් සියලු දෙනාම ළමා නිවාසයට ආවා.




ළමා නිවාසයේ අය ඔවුන්ව සිනා මුසු මුහුනින් පිළිගත්තා.

"අන්න බලන්න තාත්තේ එයාලාගේ මුහුණේ හිනාවේ ලස්සන" කියා ලොකු දියණිය තාත්තාට කිවුවා.

"ඔව් එයාලා හරිම කැමතියි කවුරු හරි එයාලාව බලන්න එනව නම් දුවේ" කියා තාත්තා කිවුවා.

"දැන් අපි මේ යාළුවන්ට ඉක්මණින් බත් කන්න දෙමු. එයාලාට හරිම බඩගිනි ඇති නේ නේද දුවේ"

"අනේ ඔව් අම්මේ අපි ඉස්සෙල්ලා මෙයාලාට බත් කන්න දීලා ඊට පස්සේ කේක් කපමු කියා ලොකු දියණිය ද කිවුවා. ඉන්පසු ළමා නිවාසයේ සියලු දෙනාටම කෑම බෙදලා දුන්නා.





“අර බලන්න අම්මේ චූටි නංගි
කෙනෙක් ඉන්නවා. එයාට තනියෙන්
බත් කන්න බෑ වාගේ. මම ගිහින්
එයාට බත් කවන්න ද?” කියා ලොකු
දියණිය අම්මාගෙන් ඇසුවා.
“හරිම හොඳයි ඔයා එයාට බත් ටික
කවන්න ” කියා අම්මා කිවුවා.
ලොකු
දියණිය
ඉතාමත්
සතුටින් චූටි
නංගිට ද
බත් කැව්වා.
සියලු
දෙනාටම
හොඳින් කෑම කන්න දුන්නා. එයාලා
හරිම සතුටින් කෑම කෑවා.

ටික වෙලාවකින් ඔවුන් ළමා නිවාසයේ සියලු දෙනාගේ සුභ පැතුම් මැද ලොකු දියණිය කේක් කැපුවා. තාත්තා, අම්මා නංගිට වාගේ ම ළමා නිවාසයේ සියලු දෙනාටම දියණිය කේක් කැව්වා. එයාලා හරිම සතුටින් කේක් කෑවා.

"මට නම් හරිම සතුටුයි තාත්තේ අම්මේ මගේ උපන් දිනය හැම සැරේම මෙහෙ සමරමු" කියා ලොකු දියණිය සතුටින් කිවුවා.

"අනේ මගේ උපන් දිනයත් මෙහෙ සමරමු කියා පොඩි දියණිය කිවුවා.

"හරිම හොඳයි දුවේ. ඒක ලොකු පිනක්" කියා තාත්තා කිවුවා.



6
ළමා නිවාසය


"අපි උපන් දිනයට විතරද අම්මේ මෙහෙට එන්නේ" කියා ලොකු දියණිය ඇසුවා.

"නෑ පුංචි අපිට පුලුවන් හැම වෙලාවෙම අපි දුවගේ යාලුන් යාලුවන්ට ඇඳුම් ,සෙල්ලම් බඩු තෑගි කෑම බීම අරගෙන මෙහෙ එමු" කියා අම්මාත් තාත්තාත් කිවුවා.

"හරිම හොඳයි අපි අපිට පුලුවන් හැම වෙලාවෙම ඇවිත් යාළුවො බලන්න එමු" කියා ඔවුන් අලුත් යාළුවන්ගෙ සතුටු කඳුළු මැද ළමා නිවාසයෙන් පිටත් වුනා.

ඔයාලත් හැකි අයුරින් අසරණ අයට උදවු කරන්න.





# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්